ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි මස 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි මස 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සුරාබදු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මත්පැන් අපනයනය මත සුරාබදු මුදල් අවකරණය

සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළ මත්පැන් අපනයනය මත වූ සුරාබදු මුදල් ගිණුම්ගත කිරීම පරික්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 වර්ෂයට අදාලව නිෂ්පාදනාගාර විසින් දේශීයව නිපදවන මත්පැන් අපනයනය මත වූ බදු අවකරණ වටිනාකම අදාල නිෂ්පාදන බදු වලින් අඩුකර ශුද්ධ සුරාබදු ආදායම පමණක් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගතකර තිබුණි. මේ අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ මත්පැන් මත බදු ආදායම රු. 12,194,197,179 කින් පමණ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී, ආදායමෙන් ආපසු ගෙවීමට හෝ වැය ශීර්ෂයකින් ගෙවීමේදී පවතින දුෂ්කරතා හේතුවෙන් දැනට පවතින ක්‍රමවේදය අනුගමනය කිරීමටත් මූල්‍ය ප්‍රකාශන තුළ ආදායම් ගිණුම් මගින් බදු අවකරණ වටිනාකම සටහනක් මගින් හෙළිදරව් කිරීමට තීරණය විය.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූලව ආදායම් ගිණුම් තැබිය යුතුය.
(ii)	අපනයනය කරන මත්පැන් වලට අදාල බදු මුදල් ආපසු ගෙවීම ගිණුම්ගත කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට සුදුසු වැය විෂයයක් (Vote) හා අවශ්‍ය ප්‍රතිපාදන සහ එම වැය විෂයය මගින් අදාල සුරාබදු අවකරණ මුදල ගිණුම්ගත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබානොදීම මත සුරාබදු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු. 12,194,197,179 කින් පමණ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනයන් තුළ ඉටුකළ නොහැකිවීම නිසා මෙම තත්වය ඇති වී ඇත.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූලව වියදම් ගිණුම් තැබිය යුතුය.

1.6.2 මූලධන වියදම්

මූලා ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීම් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සුරාබදු තැගි අරමුදලේ වත්කමක් වන පනාදරගම සුරාබදු අභ්‍යාස විද්‍යාලයේ ගොඩනැගිලි අළුත්වැඩියාවක් සඳහා වූ රු. 2,010,657 ක් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දරා තිබුණු අතර එය සුරාබදු දෙපාර්තමේන්තුවේ 2001 ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේදී සුරාබදු තැගි අරමුදලින් අදාල වටිනාකම ඉවත් කර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කිරීමට උපදෙස් හා මඟ පෙන්වීම ලබා දෙන ලදී.	නිවැරදි වැය විෂයන් මත ගිණුම් තැබීම සිදුකල යුතුයි.

1.6.3 තැන්පතු ගෙවීම්

මූලා ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීම් පරීක්ෂා කිරීමේදී සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කාර්මික අපරාධ වාර්තා වෙනුවෙන් සමථ ගාස්තු අයකර ගැනීම සඳහා තැන්පත් කල රු. 5,285,845 ක් හා අනෙකුත් තැන්පතු වෙනුවෙන් තැන්පත් කල රු. 203,500 ක් ලෙස එකතුව රු. 5,489,345 ක තැන්පතු ශේෂයන් 2024 දෙසැම්බර් 31 දින වන විට පියවා අවසන් කර තිබුණද, එම ශේෂයන් තව දුරටත් තැන්පත් ගිණුම් අංක 6000-0-0-0-1-0-122-0 ඇප තැන්පතු ගිණුම යටතේ දක්වා තිබුණි.	පියවා අවසන් කරන ලද කාර්මික අපරාධ වාර්තා වෙනුවෙන් සමථ ගාස්තු අයකර ගැනීම සඳහා තැන්පත් කරන ලද මුදල් හා අනෙකුත් තැන්පත් වෙනුවෙන් වූ තැන්පතු ශේෂයන් තැන්පතු ගිණුමෙන් ඉවත් කර නිවැරදි කිරීමට වගකිවයුතු නිලධාරියාට අදාළ උපදෙස් හා මඟපෙන්වීම ලබාදෙන ලදී.	2024 දෙසැම්බර් 31 දින වන විට පියවා අවසන් කර ඇති තැන්පතු ශේෂයන් තැන්පත් ගිණුම් තුලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුය.

1.6.4 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීම් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 31 දිනට මූලා ප්‍රකාශන තුල ඉඩම් වටිනාකම රු. 282,680,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරියේදී තක්සේරු වාර්තා ලබාගෙන ඉඩම් වටිනාකම නිවැරදි කර ගැනීම සඳහා අදාල විෂය නිලධාරියාට උපදෙස් හා මඟ පෙන්වීම ලබා දෙන ලදී.	වත්කම් සඳහා නිවැරදි තක්සේරු වටිනාකම් ලබාගෙන එම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.

(ii)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල ගොඩනැගිලි වටිනාකම රු. 259,470,329 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	විගණන නිරීක්ෂණ සමඟ එකඟ වී ඇත.	වත්කම් සඳහා නිවැරදි තක්සේරු වටිනාකම් ලබාගෙන එම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.
(iii)	2024 වර්ෂයේ සුරාබදු තෑගි අරමුදල යටතේ මිලදීගත් රු. 6,767,300 ක වටිනාකමැති “හයිඩ්‍රොමීටර්” 25 ක් සුරාබදු දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හා උපකරණ තුල වූ රසායනාගාර උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ඉදිරිපත් කිරීමට සටහන් තබා ගන්නා ලදී.	සුරාබදු තෑගි අරමුදල යටතේ මිලදීගත් වත්කම් සුරාබදු දෙපාර්තමේන්තුවේ වත්කම් තුලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුයි.
(iv)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල කෙරීගෙන යන වැඩ (WIP) වටිනාකම රු. 190,803,318 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ඉදිරිපත් කිරීමට සටහන් තබා ගන්නා ලදී.	සත්‍ය වශයෙන්ම පවතින වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුයි.
(v)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල මූල්‍ය කල්බදු වත්කම් වටිනාකම රු. 153,111,371 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2024 මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය කල්බදු වත්කම් වටිනාකම ලෙස කැබ් රථ 19 පිරිවැය රු. 129,527,358 ක් කැබ්රථ 19 වෙනුවෙන් ගෙවන ලද කල්බදු පොළිය රු.106,283,921 ක් හා කැබ්රථ 19 වෙනුවෙන් ගෙවන ලද මුද්දර ගාස්තුව රු. 2,358,280 ක් ලෙස එකතුව රු.238,169,560 දක්වා තිබුණි.	කැබ්රථ වෙනුවෙන් ගෙවූ කල්බදු පොළී මුදල් හා මුද්දර ගාස්තු කැබ්රථ වල වටිනාකමින් ඉවත් කර සත්‍ය පිරිවැය පමණක් දේපළ පිරියත යටතේ ගිණුම් තැබීම කල යුතුය.
(vi)	2024 දෙසැම්බර් 31 දිනට පැවති අලවා සක්‍රීය නොකරන ලද ආරක්ෂිත සලකුණු වල පිරිවැය වූ රු. 36,120,593 ක් ගිණුම්ගත කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	සියලුම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු 1.6.1. (අ) iv , 1.6.1. (ඈ) iv සහ 2.1. (ඈ) ii යන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 හිඟහිටි ආදායම්

හිඟහිටි ආදායම් සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල හිඟ ආදායම රු. 24,442,751 ක් අඩුවෙන් දක්වා තිබුණි.	එක් මත්පැන් නිෂ්පාදන ආයතනයක අපතය සඳහා වන මුදල රු. 24,442,751 මූල්‍ය ප්‍රකාශනයේ සටහන් නොවීම මෙම වෙනසට හේතුවේ.	මූල්‍ය ප්‍රකාශන තුල අදාල සියලු තොරතුරු නිවැරදිව ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය.
(ii)	වර්ෂාවසාන දිනට වසර 05 කට වැඩි කාලයක සිට ආයතන 05 කින් හිඟ සුරාබදු ආදායම් රු.1,702,131,279 ක් හා ප්‍රමාද ගාස්තුව රු. 4,635,465,422 ක් ලෙස එකතුව රු. 6,337,596,701 ක් අයකරගත යුතුව තිබුණි.	• ග්ලෝබ් බ්ලෙන්ඩර්ස් ආයතනයෙන් අයවිය යුතු 1,171,003,827 ක මුදල අයකර ගැනීම සඳහා නිතිමය ක්‍රියාමර්ග ගැනිමට නිතිපතිට යොමු කිරිමට කටයුතු සිදු කරමින් පවති. • වයඹ ස්ප්‍රීතු තොග ගබඩාවෙන් අයවිය යුතු 289,408,594 ක මුදල අයකර ගැනීම නිතිමය ක්‍රියාමර්ග ගැනිමට නිතිපතිට යොමු කිරිමට කටයුතු සිදු කරමින් පවති. • වයඹ ඩිස්ටලරිස් ආයතනයෙන් අයවිය යුතු 577,391,758 ක මුදල අයකර ගැනීම සඳහා අංක CA (Writ) 649/2023 දරණ නඩුව අධිකරණයේ ගොනු කර ඇති බව නීති අංශය තහවුරු කර ඇත. එම නඩුවේ තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත.	හිඟ අදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

- මැකලම් බෲවරි ආයතනයෙන් අයවිය යුතු 619,964,802 ක මුදල අයකර ගැනීම සඳහා අංක SP/SPL/LA/29/2020 දරණ නඩුව අධිකරණයේ විභාග වෙමින් පවති. එම නඩුවේ තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත.

- ඩබ්.එම්.මෙන්ඩිස් සහ සමාගමෙන් අයවිය යුතු 3,679,827,717 ක මුදල අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ගොඩනැගීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් 2022 - 2024 කාලය තුල එකතුව රු. 1,041,800,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුනද, 2024 වර්ෂාවසානය වන විට කිසිදු මුදලක් උපයෝජනය කර උක්ත පද්ධතිය සංවර්ධනය කිරීමට අදාල කාර්යයන් සිදු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ලබන ප්‍රතිපාදනයන් අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා නිවැරදිව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය.

4.2 වත්කම් කළමනාකරණය

වත්කම් කළමණාකරණය සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂාවසාන දිනය දක්වා දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම් 15 ක නීත්‍යානුකූල හිමිකම ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී තක්සේරු වාර්තා ලබාගෙන ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉඩම් වටිනාකම නිවැරදි කර ගැනීම සඳහා අදාල විෂය නිලධාරියාට උපදෙස් හා මඟපෙන්වීම ලබා දෙන ලදී.	දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කල යුතුයි.

4.3 පාඩු හා හානි

4.3.1 විදුලි ජනක යන්ත්‍රයේ උපාංග අස්ථානගත වීම

සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර තිබූ විදුලි ජනක යන්ත්‍රයේ කොටස් අස්ථානගතවීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව ආරක්ෂක සේවා සමාගමක සේවය ලබාගෙන තිබියදී 2023 සැප්තැම්බර් මස 04 දින කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර තිබූ විදුලි ජනක යන්ත්‍රයේ කොටස් අස්ථානගතවී තිබුණි. පසුව රු. 3,297,050 ක සේවා ගිවිසුමක් මත විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියා කර ඇතත් විගණන වාර්තාවේ දිනය දක්වා විදුලි ජනක යන්ත්‍රය ක්‍රියාකාරී තත්වයට පත්කර නොතිබුණි. සිද්ධිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් පත්කරන ලද පරීක්ෂණ කමිටුව විසින් පරීක්ෂණය සිදුකර 2025-04-10 දින පූර්ණ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ මත පොදු 284, පොදු 285 අයදුම්පත සම්පූර්ණ කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර ඇත.	වත්කම් වල ආරක්ෂාව වෙනුවෙන් මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර පවත්වාගෙන යාමට කටයුතු කල යුතුයි.

4.3.2 මත්පැන් නිෂ්පාදනාගාරයක සිදුවූ ගිනි ගැනීමෙන් ආරක්ෂිත සලකුණු විනාශ වීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දංකොටුව ප්‍රදේශයේ පවත්වාගෙන යන මත්පැන් නිෂ්පාදනාගාරයක 2024 මැයි 26 දින ගින්නක් ඇතිවී මත්පැන් බෝතල්වල අලවන ආරක්ෂිත සළකුණු තොගයක් විනාශ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂනයන් සිදු කෙරේ. • 2024 අගෝස්තු 12 දිනැති රජයේ රස පරීක්ෂණ වාර්තාවට අනුව මෙය සිතාමතා සිදුකල ගිනි ගැනීමක් බව තහවුරු වීම. • ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතිය අනුව ගින්න ඇතිවන අවස්ථාවේදී පැවතිය යුතු ආරක්ෂිත සළකුණු ප්‍රමාණය 8,179,194 ක් වුවත් සුරාබදු නිලධාරීන් භාරයේ 1,396,988 ක ආරක්ෂිත සළකුණු තොගයක් පමණක් පැවතීම හා ඒවා සියල්ල ගිනිගෙන තිබීම.	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ 2024 දෙසැම්බර් 27 දින ED/05/02/General-1 අංක දරණ ලිපිය මඟින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් විමර්ශනය කර අලාභ අයකර ගැනීමට කටයුතු කිරීමට දන්වා ඇත. සැපයුම්දාම නියාමන අංශයෙන් එක් එක් ප්‍රමාණයේ මත්පැන් නිෂ්පාදිතයන්ට අනුව නිකුත් කර ඇති ආරක්ෂිත සළකුණු තොගයට අදාලව රජයට අයවිය යුතු උපරිම බදු මුදල ගණනය කර අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. සැපයුම්දාම නියාමන අංශය විසින් ආරක්ෂිත ස්ටිකර් නිෂ්පාදනාගාර වෙත නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී තොග	උක්ත නිරීක්ෂණයන් සම්බන්ධයෙන් විධිමත් විමර්ශණයක් සිදුකර වගකිව යුත්තන් හඳුනාගෙන නීත්‍යානුකූලව හා විනයානුකූලව කටයුතු කල යුතුය.

• අදාල නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන ධාරිතාව අනුව 8,179,194 ක ආරක්ෂිත සළකුණු තොගයක් ලබාදීම අසාමාන්‍ය තත්ත්වයක් ලෙස නිරීක්ෂණය වීම. • අස්ථානගතවී ඇති ආරක්ෂිත සළකුණු භාවිතය මඟින් අයකරගත හැකිව තිබූ රු. 4,117,520,819 ක බදු ආදායමක් අහිමි වී තිබීම. • ගින්න සිදුවන අවස්ථාවේදී CCTV කැමරා පද්ධතිය අක්‍රීය වී තිබීම හා සහතික කර ඇති ගිනි ආරක්ෂණ පද්ධතිය මඟින් ගින්න පාලනය කර නොතිබීම. උක්ත නිරීක්ෂණයන් සම්බන්ධයෙන් විධිමත් විමර්ශණයක් සිදුකර වගකිව යුත්තන් හඳුනාගෙන නීත්‍යානුකූලව හා විනයානුකූලව කටයුතු කිරීමට හා අහිමි වූ බදු ආදායම අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	සම්බන්ධ පාලනයක් සිදු කිරීම සඳහා අදාල ඉල්ලුම් කරන ලද තොගයන් අදාල නිෂ්පාදනාගාරයේ සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරි හා සහකාර සුරාබදු කොමසාරිස් විසින් අනුමත කිරීමෙන් පසුව එම තොගයන් නිකුත් කිරීමට ආරක්ෂිත ස්ටිකර් කළමනිකරණ පද්ධතිය සකස් කොට ඇත. වර්තමානයේ නිෂ්පාදනාගාරවල පවතින CCTV පද්ධති, ගිනි ආරක්ෂණ පද්ධති, සේවක සුභ සාධක පහසුකම් පිළිබඳව නිරන්තර නියැදි පරීක්ෂාවන්ට ලක්කරන ලෙස උපදෙස් හා මඟපෙන්වීම් ලබා දී ඇත.

4.3.3 ව්‍යාජ මත්පැන් බෝතල් හා ස්ප්‍රීතු තොග අත්අඩංගුවට ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
එතනෝල් ස්ප්‍රීතු ලීටර් 5,000 ක් හා මත්පැන් බෝතල් 8,446 ක් දංකොටුව ප්‍රදේශයේ පවත්වාගෙන යන මත්පැන් නිෂ්පාදනාගාරයකට අයත් ලොරි රථ 3 ක් තුල සහවා පෞද්ගලික පරිශ්‍රයක් තුල තිබියදී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණ කමිටුව ඉදිරිපත් කල වාර්තාව හා ප්‍රශ්නගත සිද්ධිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකෙරේ. • එතනෝල් මිලදී ගැනීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව නිකුත් කල බලපත්‍ර ලෙස සුරාබදු දෙපාර්තමේන්තුවේ ලිපි ගොනු අංක දෙකක් භාවිතා කරමින් කූට ලේඛණ දෙකක් සකස්කර අවස්ථා දෙකකදී පැලවත්ත සීනි සමාගමේ ස්කාගාරයෙන් එතනෝල් ලීටර් 5,000 බැගින් ලීටර් 10,000 ක් වංචනිකව ලබා ගැනීම.	විශයගත කරුණ සම්බන්ධයෙන් සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අමතරව අදාල ස්කාගාරයේ හා මත්පැන් නිෂ්පාදනාගාරයේ කාර්ය මණ්ඩලයෙන්ද වෙනත් තුන්වෙනි පාර්ශවයන්ගෙන්ද වාචික ප්‍රකාශන හා සාක්ෂි රැස්කර ගැනීමට අවශ්‍ය වීමත්, අපරාධ නීති විධි විධානයන්ට අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පැවතීම නිසා එම අධිකාරී බලය හිමිවී ඇති නීතිපති දෙපාර්තමේන්තුව හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කටයුතු කිරීමට පහත පරිදි යොමුකර ඇත. (අ) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම)	කූට ලේඛණ සැකසීම, ඉදිරිපත් කිරීම හා අයවිය යුතු බදු මුදල් සැලසුම්සහගතව පැහැර හැරීම සම්බන්ධයෙන් කඩිනමින් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

- මෙලෙස කූට ලේඛණ භාවිතයෙන් මිලදී ගත් එතනෝල් ලීටර් 10,000 ක් හා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් මිලදීගත් එතනෝල් ලීටර් 5,000 ක් ඇතුළු ලීටර් 15,000 ක් මත්පැන් නිෂ්පාදනාගාරය වෙත ගෙනවිත් නොතිබීම.
- ලොරි රථයක් තුල සඟවා පෞද්ගලික පරිශ්‍රයක තිබී අත්අඩංගුවට ගත් මත්පැන් බෝතල් 8,446 ක ප්‍රමාණය එම නිෂ්පාදනාගාරය තුල නිෂ්පාදනය නොවූ හා බදු ගණනයන්ට ඇතුලත් නොවූ නිෂ්පාදන බව හඳුනාගෙන තිබීම.

- උක්ත නීතිවිරෝධීව නිෂ්පාදනය කර ඇති මත්පැන් බෝතල් 8,446 හි සුරාබදු දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද නීත්‍යානුකූල ආරක්ෂිත සලකුණු අලවා තිබීම.

- නිෂ්පාදනාගාරය වෙත ගෙනගොස් නොතිබූ එතනෝල් ලීටර් 15,000 විෂයෙහි රු. 98,667,000 ක සුරාබදු ආදායමක් අහිමි වී ඇති අතර නීති විරෝධීව නිෂ්පාදනය කල මත්පැන් බෝතල් 8,446 විෂයෙහි රු. 4,171,991 ක සුරාබදු ආදායමක් අහිමි වී තිබීම.

උක්ත නිරීක්ෂණයන් සම්බන්ධයෙන් විධිමත් විමර්ශණයක් සිදුකර වගකිව යුත්තන් හදුනාගෙන නීත්‍යානුකූලව හා විනයානුකූලව කටයුතු කිරීමට හා අහිමි වූ බදු ආදායම අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

ගේ 2025 මාර්තු දින රහිත ED/05/02/Gen අංක දරණ ලිපිය මගින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත විෂය ගත කරුණු යොමුකර තිබීම.

(ආ) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ 2025 මැයි 23 දිනැති ED/09/01/072025 අංක දරණ CA/WRIT/694/2024 ලිපිය මගින් අධිකරණ කටයුතු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

4.4 කළමනාකරණ දූර්වලතා

4.4.1 ව්‍යාජ ආරක්ෂිත සළකුණු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ 2024 ජනවාරි හා පෙබරවාරි මාස වල සිදුකර තිබූ විශේෂ විමර්ෂණයකදී මත්පැන් අලෙවිසැල් 16 කින් ව්‍යාජ ආරක්ෂිත සළකුණු අලවා ඇති බවට සැක සහිත මත්පැන් බෝතල් 54,887 ක් අත්අඩංගුවට ගෙන තිබූ අතර ඉන් මත්පැන් බෝතල් 12,170 ක් ව්‍යාජ ආරක්ෂිත සළකුණු සහිත මත්පැන් බෝතල් බව හදුනාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකල පරික්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. • ව්‍යාජ ආරක්ෂිත සළකුණු අලවා තිබූ මත්පැන් බෝතල් වල අඩංගුව තිබූ ලේබලයේ සඳහන් නිෂ්පාදනාගාර එකී මත්පැන් සඳහා අදාල බදු හා දඩ මුදල් ගෙවා සිදුවීම සමථයකට පත්කරගෙන ඇතත් මෙම ව්‍යාජ ආරක්ෂිත සළකුණු මුද්‍රණය කල ආකාරය, ආයතන, සම්බන්ධ වූ පුද්ගලයින් හා නැවත එවැනි සිදුවීමක් සිදු නොවීම සඳහා පරීක්ෂණයන් සිදුකර නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. • මෙවැනි ව්‍යාජ ආරක්ෂිත සලකුණු සහිත මත්පැන් බෝතල් අනෙකුත් පළාත්වලට බෙදාහැර ඇත්ද, නැවතත් මෙවැනි ව්‍යාජ නිෂ්පාදන සිදුවන්නේද හා ඒ සම්බන්ධයෙන් ගතයුතු වැලැක්වීමේ පියවරයන් සම්බන්ධයෙන් අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.	ව්‍යාජ ආරක්ෂිත සළකුණු සහිත මත්පැන් බෝතල් වෙළඳ පොළට පැමිණීම සම්බන්ධයෙන් අදාළ ව්‍යාජ ආරක්ෂිත සළකුණු මුද්‍රණය කිරීම හා නිෂ්පාදන ආයතන වෙත ලැබුණු ආකාරය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම හා අදාල ව්‍යාජ ආරක්ෂිත ස්ටිකර් මුද්‍රණය කරන ආයතන හෝ පුද්ගලයන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම රාජ්‍ය ආදායම අහිමි කිරීමට කටයුතු කිරීම හා වංචනික කටයුතු කිරීම සම්බන්ධයෙන් එමනිෂ්පාදන ආයතන වෙත නෛතික ක්‍රියාමාර්ග ගැනීම නීති ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් ඉටු කරනු ලබන අතර ඉදිරියේදී අදාළ නිෂ්පාදනාගාර සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන අතර වර්තමානය වන විට ව්‍යාජ ආරක්ෂිත ස්ටිකර් මුද්‍රණය කල නොහැකි පරිදි අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කර ඇත.	විධිමත් පරීක්ෂණයක් පවත්වා කඩිනමින් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.

4.4.2 මධ්‍යම රසායනාගාරය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සුරාබදු දෙපාර්තමේන්තුව රු. 43,571,412 ක් වැය කර ඉදිකරන ලද මධ්‍යම රසායනාගාරය තුල පරීක්ෂණ කටයුතු 2025 ජනවාරි මාසය තුල ආරම්භ කිරීමට සැලසුම් කර ඇතත් මානව සම්පත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන නියමිත කාල රාමුවකට අනුව සුදුසු තාක්ෂණික නිලධාරීන් බඳවා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.	ජා.අ.ච.01/2024 වියදම් පාලන චක්‍රලේඛයට ප්‍රකාරව නව සේවා සඳහා බඳවා ගැනීම අත්හිටුවීම මත මෙම තත්වය ඇතිවූ අතර ඉතා ඉක්මනින් නව බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.	කඩිනමින් සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කල යුතුයි.

4.5 නව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් 2024 පෙබරවාරි 06 දින සිට 2024 සැප්තැම්බර් 24 දින දක්වා කාලය තුලදී මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර.බී. 04) නිකුත් කිරීම සම්බන්ධයෙන් සිදුකල පරික්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. • සුරාබදු බලපත්‍ර ලබා ගැනීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත අවස්ථාවක් ලැබෙන පරිදි අභිලාශයන් කැඳවීමකින් තොරව අදාල සුරාබදු බලපත්‍ර නිකුත් කර තිබුණි. • 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනතේ 31 වගන්තියට අනුකූල නොවන සේ වයස අවුරුදු 21 ට අඩු තැනැත්තන් සඳහා හා වයස 21 අඩු තැනැත්තන් අධ්‍යක්ෂක ධුරයන් දරන පෞද්ගලික සමාගම් වෙත බලපත්‍ර නිකුත් කර තිබුණි. • මත්පැන් සිල්ලරට විකිණීමේ සුරාබදු බලපත්‍ර (ර.බී. 04) ලබාදීමට මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය සහිත ලිපියේ අදාල අදාල සුරාබදු බලපත්‍රය පැවරීම / විකිණීමට නොහැකි වන සේ අදාල ඉල්ලුම්කරු නමින් නිකුත් කරන ලෙස නියෝග කර තිබුණි.	සුරාබදු දෙපාර්තමේන්තුව මගින් දැනට ශ්‍රී ලංකාව තුළ සුරාබදු මත්පැන් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සුරාබදු ආඥා පනත හා සුරාබදු නිවේදන 902, 02/2024 හා 03/2024 අනුව සිදු කර ඇත. මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රසිද්ධ දැන්වීම් මගින් අභිලාෂයන් කැඳවීමක් සිදු නොකරයි. මේ සඳහා ප්‍රධාන හේතුව වී ඇත්තේ මත්පැන් අලෙවිහලක් ස්ථාපිත කිරීමට නිශ්චිත ස්ථානයක් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතුවී නොමැති වීමත්, සුරාබදු පනත අනුව මත්පැන් අලෙවිහලක් ස්ථාපිත කළයුතු ස්ථානය සඳහා මහජන විරෝධතා, පාසැල්, පූජනීය ස්ථාන දුර සීමාවන් ප්‍රධාන සාධක වන නිසා ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමනය කළ නොහැක.	සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේදී ඒ සඳහා උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ට සාධාරණ අවස්ථාවක් ලැබෙන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමයට කටයුතු කල යුතුයි.

මුදල් අමාත්‍යවරයාගෙන් එසේ නියෝගයක් ලැබී තිබියදී එම නියෝගය අදාල සුරාබදු බලපත්‍රයේ හෝ ඊට අදාල කොන්දේසි තුල හෝ ඇතුලත් කිරීමට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. මෙම වාර්තාවේ දිනය වන විට එම බලපත්‍ර අතුරින් බලපත්‍ර 05 ක් වෙනත් පාර්ශවයන් වෙත පවරා තිබුණු අතර තවත් බලපත්‍ර 02 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය ඇටෝර්නි බලපත්‍ර මගින් වෙනත් පාර්ශවයන් වෙත ලබාදී තිබුණි.

- 2024 ජනාධිපතිවරණ කාල සීමාව තුල (2024 ජූනි 26 දින සිට 2024 සැප්තැම්බර් 21 දක්වා කාලය තුල) මත්පැන් සිල්ලරට විකිණීමේ සුරාබදු බලපත්‍ර (ර.බී. 04) නිකුත් කිරීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් සමාංක EDR/PE/2024/N-281 දරන 2024 අගෝස්තු 13 දිනැති හා 2024 අගෝස්තු 19 දිනැති ලිපි මඟින් බලපත්‍ර විවිධ පාර්ශව වෙත විකිනීම මඟින් මහා පරිමාණ මූල්‍ය වංචාවන් හා විවිධ දේශපාලන කණ්ඩායම් ප්‍රවර්ධනයක් සිදුවීමට ඉඩ ඇති බැවින්, ඒ සඳහා විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කර විනිවිදභාවයකින් යුතුව බලපත්‍ර ලබාදීමට කටයුතු කරන මෙන් දන්වා තිබුණි. එහෙත් එවැනි විධිමත් ක්‍රියාවලියකින් තොරව ජනාධිපත්වරණ කාල සීමාව තුල මත්පැන් සිල්ලරට විකිණීමේ සුරාබදු බලපත්‍ර (ර.බී. 04) 88 ක් නිකුත් කර තිබුණි.

- ජනාධිපතිවරණයෙන් පසුව නව ජනාධිපතිවරයා දිවුරුම් දීමෙන් අනතුරුව නව රජයේ වැඩපිළිවෙල, ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අවධානය යොමුකොට ඊට අදාල වෙනත් අනුමැතීන් ලබාගැනීමකින් තොරව මත්පැන් සිල්ලරට විකිණීමේ සුරාබදු බලපත්‍ර (ර.බී. 04) 02 ක් ලබා දීමට කටයුතු කර තිබුණි.

නමුත් සුරාබදු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ලද පසු සුරාබදු නිවේදන 902, 02/2024 සඳහන් ගාස්තු අයකර අයදුම්පත්‍රයක් නිකුත් කිරීම සාමාන්‍ය ක්‍රමවේදයයි. ඒ අනුව සුරාබදු දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.